# අසිරිය ලැබෙන ගොවිතැන අතහරිනවද?

සිරිලක පරසිදුය පොරණේ ගොවිතැන ට
සිහල සහල් නැව් යැව්වේ පිටරට ට
බිම් අගලක්නොහැර සිරිලක වපුරන් ට
කාලය පැමිණ ඇත දහදිය වගුරන් ට

දවසින් දවස ජනගහනය වැඩිවෙන් නේ
කම්මල් හා ගෙවල් හැමතැන ඉදිවෙන් නේ
ගොවිබිම් නිසරු වී අස්වනු අඩුවෙන් නේ
කෑමට පිටරටුන් හට දත නියවන් නේ

පැනට පැන්සලට අතහුරු කෙරුවා ට
ජිවිත ගැට ගසා ගනු බැහැ ඉන් සැම ට
කැත්තෙන් උදල්ලෙන් කෙරෙනා ගොවිතැන ට
පිටුපා ගියොත් ජාතිය වැටෙනව වල ට

උරුමව තිබූ සරුපස අහිමිව යන වා
පස්කඳු කැපී කෙත්වතු වැසිලා යන වා
ගොවිතැන් නසන්නට ජාතිය සැරසෙන වා
වැඩිකල් නොගොස් මුළු හෙලයම වැනසෙන වා

රජුට උවත් ගොවිඳුගෙ පිහිටයි ඇත් තේ
සිහසුන දැරීමට ඉන් උරුමය ඇත් තේ
දහඩිය හෙලා බත දී සැම රැකගත් තේ
දැයට සම්පතකි ඔබ මහ පින් ඇත් තේ

ජාතියෙ කුසගින්න නිවනා ගොවිතැන ට
තිසිතැන හොඳි රැවටී හොරවුන් බස ට
අඩිතාලමක් නොමැතිව සදනා ගෙය ට
ලබනා කල දසාවම මේ සිරි ලක ට

සොයුරු සොයුරියනි මොහොතක් සිතුවා ද
ගොවිතැන නැතුව දිනුවේ ලොව කොයි රට ද
පෙරදා සිරිය දෙස හැරිලා බැලුවා ද
අසිරිය ලැබෙන ගොවිතැන අත හරිනව ද

මාතර, ගොඩගම
මඩිහ ගොවිජන කේන්ද්‍රයේ
කෘෂිකර්ම උපදේශිකා
ස්වර්ණා සමරවික්‍රම විසිනි